සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

51	S	II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

Second Term Test - Grade 12 - 2020

විභාග අංකය ..... චිත්‍ර II කාලය පැය තුනයි

<u>අයදුම්කරුවන්ට උපදෙස්</u>

- ඔබේ නම/විභාග අංකය ඔබ චිත්‍රය අඳින කඩදාසියේ පසුපිටේ පැහැදිලිව ලියන්න.
- දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකිය. (පෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- සියළුම ද්‍රව්‍ය ඇස් මට්ටමෙන් පහළ සිටින සේ තැබීමට උපදෙස් ලබාදී ඇත.
- උත්තර පත්‍ර විභාග ශාලාධිපතිට භාරදුන විට එය වියලී තිබියි යුතුයි.

නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය.

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය සහිත පැලෑටිය හෝ රිකිල්ල පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් ඇඳ වර්ණ කරන්න.
- කඩදාසි තලය අර්ථවත්ව භාවිතා කරමින් චිත්‍රය සැලසුම් කිරීම.
- එකිනෙක ද්‍රව්‍යයන්ගේ ස්වභාවයන් හා පරිමාණ හොඳින් අවබෝධ කරගෙන චිත්‍රයට නැගීම.
- ඇස් මට්ටම, පර්යාව ලෝකය හා ත්‍රිමාණ ලක්ෂණ අවබෝධයෙන් යුක්තව භාවිතා කිරීම.
- ගති ලක්ෂණ හා මතුපිට ස්වභාවය දැක්වෙන පරිදි වර්ණ මාධ්‍ය හැසිරවීමේ ශිල්ප ක්‍රමය අර්ථවත්ව භාවිතා කරමින් ද්‍රව්‍ය සමූහයට ගැලපෙන වර්ණවත් පසුබිමක් යෙදීම.
- චිත්‍රයේ සමස්ථ නිමාව පිළිබඳ සැලකිලිමත් වීම
- ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ලේ පරිමාණය ඔබගේ චිත්‍රයට ගැළපෙන පරිදි වෙනස්කර ගැනීමට ඔබට නිදහස ඇත.

අභිමතාර්ථ :-

1. ස්වභාවික හා නිර්මිත වස්තූන්ගේ ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව සිද්ධාන්ත භාවිතය පිළිබඳ කුසලතාවය හා ක්‍රම ශිල්ප භාවිතය මැන බැලීම.
2. රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තූන්ගේ ගති ලක්ෂණ නිරූපණය වනසේ ප්‍රකාශ කිරීමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.
3. වර්ණ භාවිතා කිරීමේ ක්‍රම ශිල්ප හා වස්තූන්ගේ ගති ලක්ෂණ මතුවන සේ වර්ණ භාවිතය පිළිබඳ හැකියාව මැන බැලීම.

ලකුණු දීමේ නිර්ණායකඃ-

01. තලය අර්ථවත්ව හැසිරවීමේ හැකියාව (ල. 20)
02. ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව (ල. 20)
03. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාවලෝකය,ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම, අවකාශ භාවිතය) (ල. 20)
04. වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම. (ල. 20)
05. චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ත නිමාව (ල. 20)

II වන ප්‍රශ්න පත්‍රය සඳහා හිමිවන මුළු ලකුණු 100